# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## මුදල් නීති (සංශෝධන)

**(422 වන අධිකාරය වූ) මුදල් නීති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්
2014 මාර්තු මස 21 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2014 මාර්තු මස 10 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[300 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 3.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2—PL 008085—525 (2014/03)

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ 6 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ මහ බැංකුවෙහි ප්‍රාග්ධනය රුපියල් බිලියන පනහකට නොවැඩි මුදල් ප්‍රමාණයකට වැඩි කිරීම වේ.

එල්. ඩී.—ඕ. 13/2014.

# (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

**1.** මේ පනත 2014 අංක දරන මුදල් නීති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**422 වන අධිකාරයේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**2.** (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ 6 වන වගන්තිය, ඒ වගන්තියේ "ඒ මුදල, ව්‍යවහාර මුදල් කොමසාරිස්වරුන්ගේ මණ්ඩලයේ වත්කම් අතිරික්තයෙන් බැංකුව වෙත මෙයින් හිමිකර දෙනු ලැබේ." යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

> "ඒ මුදල, ව්‍යවහාර මුදල් කොමසාරිස්වරුන්ගේ මණ්ඩලයේ වත්කම් අතිරික්තයෙන් බැංකුව වෙත මෙයින් හිමිකර දෙනු ලැබේ:
>
> එසේ වුව ද, මුදල් මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවෙහි මූල්‍ය පද්ධතියෙහි ශක්‍යතාවය සහ ස්ථාවරභාවය සැලකිල්ලට ගෙන, ජාතික ආර්ථිකයෙහි යහපත උදෙසා, කලින් කළ, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මහ බැංකුවේ ප්‍රාග්ධනය රුපියල් බිලියන පනහක් නොඉක්මවන මුදල් ප්‍රමාණයකට වැඩි කරනු ලැබිය හැකි ය.".

**අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2—PL 008030—475 (2014/03)

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.